සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2019

**06 ශ්‍රේණිය** **ඉතිහාසය** **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයිඃ
සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01 ක්‍රි.වඃ පස්වන සියවසේ දී මහානාම හිමියන් විසින් ........................................................ රචනා කර ඇත. (මහාවංශය / දීපවංශය / චූලවංශය)

02 ශ්‍රී ලංකාව අතීතයේ දී සාර්ථක ලෙස ගොවිතැන් කළ නිසා ..................................................... ලෙස හඳුන්වනු ලැබීය. (ඉන්දියන් සාගරයේ මුතුඇටය / පෙරදිග ධාන්‍යාගාරය / රතුකැට දිවයින)

03 වානර පරම්පරාවට අයත් චිම්පන්සියකුගෙන් මානවයකු බිහිවීමේ ක්‍රියාවලිය ................................................... ලෙස හැඳින්වේ. ( මානව විකාශනය / මානව පරිණාමය / මානව පරිහානිය)

04 පළමු වරට රබර් බෝලය සාදන ලද්දේ............................................ වැසියන්ය. (ඉන්දු නිම්න / හොවැංහෝ නිම්න / මායා ශිෂ්ටාචාර)

05 යුප්‍රටීස්, ටයිග්‍රීස් ගංගා පිහිටි ප්‍රදේශය වර්තමානයේ දී ................................................ හඳුන්වයි. (ඉරානය / ඉරාකය / පකිස්ථානය)

- **අංක 6 - 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06 ක්‍රිස්තුන් වහන්සේගේ උත්පත්තිය බුද්ධ වර්ෂ 544 දී සිදු විය. ( )

07 ගොඩබිම මුලින්ම ශාක පැතිරී ගියේ පේලියෝසොයික යුගයේ දී ය. ( )

08 හෝමෝ හැබිලිස් මානවයා දක්ෂ දඩයක්කරුවෙකු විය. ( )

09 මමීකරණය ලෝකයට හඳුන්වාදීමේ ගෞරවය ඊජිප්තු ශිෂ්ටාචාරයට හිමි වේ. ( )

10 මහාවංශයේ සඳහන් ආකාරයට විජය නම් කුමාරයෙක් ලංකාවේ වයඹ දිග වෙරළේ පිහිටි තම්බපණ්ණියට ගොඩබැස ඇත. ( )



LIVEWORKSHEETS

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 මිනිසා තමන්ගේ මළගිය ඥාතීන් වෙනුවෙන් අවමංගල චාරිත්‍ර පැවැත්වීමට පුරුදු වූයේ කුමන සංස්කෘතික අවධියේ ද?

(1) පූර්ව ශිලා යුගය (2) මධ්‍ය ශිලා යුගය (3) නව ශිලා යුගය (4) සිළුරියන් යුගය

12 වානරයෙකුව සිට තම ශක්තීන් දියුණු කරගෙන බුද්ධිමත් මිනිසා ලෙස නම් ලද මානවයා කවුද?

(1) හෝමෝ හැබිලස් (2) හෝමෝ ඉරෙක්ටස්

(3) හෝමෝ සාපියන් (4) හෝමෝ නියැන්ඩර් තාලෙන්සීස්

13 ඊජිප්තු ශිෂ්ටාචාරය බිහිවූයේ මින් කුමන ගංගා නිම්නය මුල්කරගෙන ද?

(1) හොවැංහෝ ගංගාව (2) සිංදු ගඟ

(3) නයිල් නිම්නය (4) යුප්‍රටීස් ටයිග්‍රීස් ගංගා නිම්නය

14 නගරයක් අසල පළමු වරට වැවක් ඉදිකළ රජතුමා පහත රජවරුන් අතරින් තෝරන්න.

(1) දේවානම් පියතිස්ස රජතුමා (2) පණ්ඩුකාභය රජතුමා

(3) දුටුගැමුණු රජතුමා (4) ධාතුසේන රජතුමා

15 දේවානම් පියතිස්ස රජතුමා විසින් භික්ෂූන් වහන්සේලාට දානය වැළඳීම සඳහා සකස් කළ ගොඩනැගිල්ල මින් කුමක්ද?

(1) මහබෝගේ (2) ලහබත්ගේ (3) වටදාගේ (4) ප්‍රතිමාගේ

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.**

16 ලෝකයේ පැරණිතම අක්ෂර පද්ධතිය නිපදවන ලද්දේ ........................................ ශිෂ්ටාචාරයේ වැසියන් විසිනි.

17 ඉන්දු නිම්නයේ වැසියන් නිවාස ඉදිකිරීමේ දී ........................................ මැටි ගඩොල් භාවිතා කර ඇත.

18 ඊජිප්තු වැසියන් පාරාවෝ රජවරුන්ගේ මළ සිරුරු තැන්පත් කළේ ........................................ වලය.

19 විජය කුමරු ඇතුළු පිරිස ලංකාවේ ජනපද පිහිටුවාගත්තේ ........................................ ඔය නිම්නයේ ය.

20 පණ්ඩුකාභය කුමරු අධ්‍යාපනය ලැබූයේ ........................................ නම් බ්‍රාහ්මණයකුගෙන් ය.

(ලකුණු 2 × 20 = 40)



LIVEWORKSHEETS